ශීර්ෂය 227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 07 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ඡායාරූපාගාර ලියාපදිංචි කිරීම තුළින් උපයාගත් රු.6,534,356ක ආදායම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ආදායම් ශීර්ෂය වන 2003.02.03 යටතේ බැරකිරීමකින් තොරව 2003.99.00 දරන වෙනත් ලැබීම් ආදායම් ශීර්ෂයට බැරකර තිබුණි.	2024 වර්ෂයේ ඡායාරූපාගාර ලියාපදිංචි කිරීමේ ආදායම එකතු කිරීමට ඇස්තමේන්තුකර ඇත්තේ 2003.99.00 ශීර්ෂය යටතේ වන අතර, විවිධ අවස්ථා වලදී විගණනය මඟින් පෙන්වාදී ඇත්තේ එම ආදායම 2003.02.03 ශීර්ෂය යටතේ ආදායමට එකතු කළ යුතු බවයි. ඒ අනුව 2025 වර්ෂයේ සිට එම ආදායම 2003.02.03 ශීර්ෂය යටතේ ගිණුම්ගත කිරීමට නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂය වන 2003.02.03 යටතේ බැරකළ යුතු ය.

(ආ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වාර්තාවෙහි (SA-82) KB-8577 යන වාහනය දෙවරක් සටහන්කර තිබූ බැවින්, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය	KB 8577 යන වාහනය 2017.01.01 දින රු.3,400,000ක වටිනාකමක් යටතේ සටහන්කර ඇති අතර, 2021.12.31 දින නැවත එය	වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට වගබලා ගත යුතු ය.

	නොවන වත්කම් වාර්තාව රු.3,400,000කින් වැඩිපුර සටහන්කර තිබුණි.	රු.7,390,000ක ප්‍රතිවටිනාකමක් යටතේ සටහන්කර ඇත. එම වත්කම නැවත අගයකර ගිණුම්ගත කිරීමේදී අත්වැරදීමකින් මෙසේ සටහන් වී ඇති බව දන්වන අතර, කඩිනමින් එය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසට නිලධාරින්ට උපදෙස් ලබාදී ඇත.	
(ii)	සමාලෝචිත වර්ෂය අවසානයට සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණය මඟින් හඳුනාගන්නා ලද අපහරණය කළ යුතු භාණ්ඩ අතරින් 2024 අප්‍රේල් 26 දින වෙන්දේසි කිරීම මඟින් වත්කම් වර්ග 08කට අදාළ අයිතම 64ක් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් වාර්තාවේ (SA-82) අපහරණයන් තුළ දක්වා නොතිබුණි.	E-NIC ව්‍යාපෘතිය මඟින් මිලදී ගෙන දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී ඇති වත්කම් සටහන් කිරීමේදී දෝෂ පවතින අතර, මෙහි දක්වා ඇති අයිතමයන් ද මේ යටතේ හඳුනාගෙන ඇති බැවින්, මේ වන විට එම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බවත් ඒ අනුව මෙම අයිතමයන් නිවැරදිව සිගාස් ගිණුම් පද්ධතියෙහි ගිණුම් තැබීමට කඩිනමින් කටයුතු කරන බවත් දන්වා තිබුණි.	වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට වගබලා ගත යුතු ය.
(iii)	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ නමට ලියාපදිංචිකර තිබූ වෑන් රථ 02ක් හා මෝටර් කාර් රථය සිගාස් වැඩසටහනට ඇතුළත්කර නොතිබුණි.	මෙහි දක්වා ඇති ENIC ව්‍යාපෘතිය යටතේ පවතින අතර, එහි NB 4809 හා NB 4840 දරන වෑන් රථ දෙක මෙම වසරේ සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට කටයුතුකර ඇති අතර, CAQ 5803 මෝටර් කාර් රථය ද කඩිනමින් සිගාස් වැඩසටහනට ඇතුළත් කරන ලෙසට නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි.	වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට වගබලා ගත යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තුව විසින් රැස්කළ ආදායම, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු.461,335,376ක් හා ආදායම් ඉපැයීම පිළිබඳ ප්‍රගති වාර්තාව අනුව රු.462,755,280ක් වූ බැවින්, රු.1,419,904ක වෙනසක් පැවතුණි.	භාණ්ඩාගාර මුද්‍රිත සටහන්හි ඇතුළත් වී ඇති ආදායම වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සත්‍ය වශයෙන් එකතු කරන ලද ආදායම පමණි. නමුත් ආදායම් ප්‍රගති වාර්තාවෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රැස්කර චෙක්පත් මඟින් ප්‍රධාන කාර්යාලය වෙත එවනු ලබන ආදායම ද (ජංගම සේවා ආදායම ද ඇතුළත්ව), වෙනත් දෙපාර්තමේන්තු මඟින් රැස්කළ ආදායම ලෙස සළකා සකස්කර ඇති බැවින් මෙම වෙනස මතු වී ඇත. අනෙකුත් ආදායම්, එනම් මොබයිල් සේවා ආදායම් ද ප්‍රගති වාර්තාවේ ආදායමට එකතු කර ඇත. එබැවින් එම වෙනස මතු වී ඇත.	වෙනත් දෙපාර්තමේන්තු විසින් රැස්කළ ආදායම, පරිගණක මුද්‍රිත සටහන් අනුව සමානවීමට අවශ්‍ය පියවරගත යුතු ය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.2,855,955,000ක් වූ අතර, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 10) අනුව මුළු වියදම රු.1,988,220,703ක් වූ බැවින්, වර්ෂය අවසානයට සමස්ත ඉතිරිය රු.867,734,297ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30ක් විය.	මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමස්ථ ඉතිරිය වන රු.867,734,297 තුළ ප්‍රධාන වශයෙන් පහත වැය විෂයයන්වල ඉතිරිවීම් ඇතුළත් වේ. • පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් සඳහා වන 227-01-01-0-2509 වැය විෂයය තුළ රු.694,398,196ක් කාඩ්පත් මිලදීගැනීමේ ප්‍රසම්පාදන අවලංගු වීම හේතුවෙන් ඉතිරිව ඇත.	දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු සැකසීමේ දී නිසි අවධානය යොමුකර සකස්කළ යුතු වේ.

		• 227-01-01-0-1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා වැය විෂයය තුළ රු.62,441,438ක් අපේක්ෂිත වියදම් පැන නොනැගීම මත ඉතිරිව ඇත. • 227-01-01-0-1403 විදුලිය හා ජලය වැය විෂයය තුළ රු.15,661,807ක් බිල්පත් ගාස්තු සංශෝධනය වීම මත ඉතිරිව ඇත. • සේවා ගිවිසුම් නියමිත කාලයන්යහිදී ගිවිසුම්ගත නොවීම හේතුවෙන් 227-01-01-1409-138 වැය විෂයය තුළ රු.23,201,322ක් ඉතිරිව ඇත.	
(ආ)	පුනරාවර්තන වැය විෂයයන් 05ක් හා මූලධන වැය විෂයයකට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,110,885,280ක මුදලකින් රු.764,467,077ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතුරුම් ලෙස පැවති අතර, එම ඉතිරිය සියයට 41 සිට සියයට 84ක පරාසයක පැවතුණි.	විදේශ ගමන් සීමා කිරීම, අපේක්ෂිත පරිදි වියදම් පැන නොගැනීම, අඛණ්ඩ විදුලි සැපයීමක් පැවැති හෙයින් විදුලි ජනක යන්ත්‍ර භාවිතය අවමවීම, ගිවිසුම අවලංගුවීමේ අවධානම සළකා ඇස්තමේන්තු කළ ආරක්ෂිත අරමුදල භාවිතයට ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනැගීම, මිල ගණන් කැඳවීමේදී ඇස්තමේන්තුගත මුදලට වඩා අවම මුදලකට ආයතනයක් තෝරාගැනීමට හැකිවීම, පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිලදීගැනීමේ ප්‍රසම්පාදනය අවලංගු වූ අතර, නැවත ඇණවුමකින් මිලදීගත් කාඩ්පත් ප්‍රමාණයෙන් ලද අගය සඳහා මෙම වසරේ ගෙවීම්කර ඇති අතර, ඉතිරිය 2025 වර්ෂයේදී ගෙවීමට නියමිත බව දන්වා තිබුණි.	වැය විෂයය සඳහා නිසි අවධානය යොමුකර ඇස්තමේන්තු සැකසිය යුතු වේ.

(ඇ)	මුදල් රෙගුලාසිය 50 ප්‍රකාරව හැකිතාක් සම්පූර්ණ හා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙළ නොකිරීම හේතුවෙන් මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකරගෙන තිබූ අතර, එලෙස මාරුකර ගන්නා ලද අමතර ප්‍රතිපාදන, ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 32 සිට සියයට 117ක පරාසයක පැවති බැවින්, ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසිඅවධානයක් සිදුකර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ලේකම්ගේ අංක 03/2024 හා 2024/01/10 දිනැති චක්‍රලේඛ උපදෙස් පරිදි නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්ට අදාළව වැඩි වූ ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා, සංචිත වාහන සඳහා ඉන්ධන වියදම් මනා කළමනාකරණයෙන් යුතුව දැරීම හේතුවෙන් මෙම වැය විෂයයේ ඉතිරිවීම් ඇති විය. නිලඇඳුම් දීමනාව ලබාගත් නිලධාරි සංඛ්‍යාව, නිලඇඳුම් දීමනාව හිමිවේ යැයි අපේක්ෂා කරන ලද නිලධාරින් සංඛ්‍යාවට වඩා අඩුවීම. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්ථාපිත හැඳුනුම්පත් ඒකකවල නඩත්තු වියදම් අනපේක්ෂිත ලෙස ඉහළ යාම. කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වෑන් රථයේ තවදුරටත් සේවා අවශ්‍යතාවයක් පැන නොනැගීම හේතුවෙන් එම රථය නැවත භාරදීම. 2024 වර්ෂය සඳහා අප දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු අගයට වඩා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් අනුමත වීම හේතුවෙන් මෙම වැය විෂයය යටතේ 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කරන ලද ග්‍රාමනිලධාරි දීමනා ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම යන කරුණු දන්වා තිබුණි.	නිසි අවධානයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කිරීමට වගබලා ගත යුතු වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPIs) තුන අතරින් ප්‍රධාන දර්ශකයක් වන "වාර්ෂික සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත් හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව" සමාලෝචිත වර්ෂයේ ප්‍රතිශතයක් ලෙස සියයට 21ක් බව නිරීක්ෂණය වූ නමුත්, 2024 කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ උක්ත කාර්යසාධන දර්ශකයේ ප්‍රතිශතය සියයට 75-89ක් අතර බවට වාර්තාකර තිබුණි.	සාමාන්‍ය සේවය යටතේ ජාතික හැඳුනුම්පත ඉල්ලුම් කළ ඉල්ලුම්කරුවන් වෙනුවෙන් ඔවුන්ගේ අවශ්‍යතාවය සලකා ජාතික හැඳුනුම්පත් නිකුත් කරනු ලැබූ අතර, පැවති කාඩ්පත් හිඟතාවය මත මුද්‍රණ අදියර දක්වා කාර්යයන් අවසන් කළ ඉල්ලුම්පත් සඳහා ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු ඇතුළත් කරමින් ජාතික හැඳුනුම්පත වෙනුවට භාවිතා කළ හැකි තොරතුරු තහවුරු කිරීමේ ලිපියක් නිකුත්කර ඇත. ඒ අනුව 2024 වර්ෂයට අදාළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ වාර්ෂික සාමාන්‍ය සේවය යටතේ ලද ඉල්ලුම්පත් හා නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 75-89ක් අතර ලෙස දක්වා ඇත්තේ එම වසරේ නිකුත්කර ඇති ජාතික හැඳුනුම්පත් හා තොරතුරු තහවුරු කිරීමේ ලිපි යන දෙකෙහි එකතුව ලෙස බව කාරුණිකව දන්වා සිටිමි.	නිකුත්කළ හැඳුනුම්පත් (card) ප්‍රමාණය මත පදනම්ව කාර්ය සාධක දර්ශක පිළියෙල කළ යුතු ය.
(ආ)	2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 5(2)(1) වන හා 15(14)වන වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන සහ වයස අවුරුදු 15ට එළැඹ ඇති හෝ එළැඹෙන සෑම තැනැත්තෙකුටම කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් එම තැනැත්තාට ජාතික හැඳුනුම්පතක් නිකුත්කළ යුතු	ජාතික හැඳුනුම්පත් මුද්‍රණය කිරීම සඳහා පෙර මුද්‍රිත කාඩ්පත් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කිහිපයක්ම දෙපාර්තමේන්තුවට පරිබාහිර වූ කරුණු හේතුවෙන් අවලංගු වූ බැවින් ජාතික හැඳුනුම්පත් මුද්‍රණය සඳහා ප්‍රමාණවත් පෙර මුද්‍රිත කාඩ්පත් තොග පවත්වා ගැනීමට නොහැකි විය. ඒ හේතුවෙන් 2005, 2006,	හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් හිස් කාඩ්පත් තොග මට්ටම් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.

වුව ද, 2024 ජනවාරි 01 දිනට ජාතික හැඳුනුම්පතක් නිකුත් නොකරන ලද අයදුම්පත් 1,055,461ක් පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් 985,209ක් ලැබී තිබූ බැවින්, මුළු අයදුම්පත් 2,040,670ක් සඳහා ජාතික හැඳුනුම්පත් නිකුත්කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කළ ජාතික හැඳුනුම්පත් ප්‍රමාණය 431,960 විය. 2024 දෙසැම්බර් 31 දිනට ජාතික හැඳුනුම්පතක් නිකුත් නොකරන ලද අයදුම්පත් 1,608,710ක් පැවති අතර, එදිනට දෙපාර්තමේන්තුව සතුව පැවති පෙර මුද්‍රිත කාඩ්පත් ප්‍රමාණය 667,820ක් පමණක් විය. ඒ අනුව ප්‍රමාණවත් පෙර මුද්‍රිත කාඩ්පත් ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී පාසල් අයදුම්කරුවන් සඳහා තොරතුරු තහවුරු කිරීමේ ලිපි 588,402ක් නිකුත්කර තිබුණි.

2007, 2008 සහ 2009 වර්ෂයන්හී උපන් පාසල් ඉල්ලුම්කරුවන් සඳහා තොරතුරු තහවුරු කිරීමේ ලිපි නිකුත් කරන ලදී. එක්දින සේවයෙන් ජාතික හැඳුනුම්පත් ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවන් සඳහා ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සිදුකළ ද, පෙර මුද්‍රිත කාඩ්පත් ප්‍රමාණය කළමනාකරණය කර ගනිමින් සිදුකළ බැවින් සාමාන්‍ය සේවයෙන් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත් සඳහා මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා භාවිත කිරීමට ද හැකිවන පරිදි තොරතුරු තහවුරු කිරීමේ ලිපි නිකුත් කරන ලදී. අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව යළි ඇණවුමක් මඟින් ලබාගන්නා පෙර මුද්‍රිත කාඩ්පත් මේ වන විට දෙපාර්තමේන්තුව වෙත ලැබෙන බැවින් 2005/02/01 සිට 2006/01/31 දක්වා උපන්, පාසල් ඉල්ලුම්කරුවන් සඳහා මේ වන විට ජාතික හැඳුනුම්පත් නිකුත් කරමින් පවතින බව දන්වා සිටිමි. තව ද, පරිගණක පද්ධතියට ඇතුළත්කර මාසයක් කල් ඉකුත් වූ ඉල්ලුම්පත්‍ර සඳහා ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතාවය සලකා ජාතික හැඳුනුම්පත් නිකුත් කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

4.2 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධන නිලධාරියෙකු ලෙස සේවය කරන ලද J.M බුද්ධි මයා 2017 අගෝස්තු 29 දින සේවය හැරගොස් තිබුණි. 2014/2015 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ක්ෂේත්‍ර නිලධාරින් සඳහා	මෙම වටිනාකම මේ වන තෙක් මෙම දෙපාර්තමේන්තුවේ වටිනාකමක් ලෙස ඇතුළත් වී නොමැති අතර, එය අලාභයක් ලෙස හඳුනාගන්නා ආකාරය පිළිබඳ පැහැදිලිකර ගැනීමට හෝ එය පොත්වලින් කපා හැරීමට	අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු වේ.

යතුරුපැදි ලබාදීමේදී මොහු විසින් යතුරුපැදියක් ලබාගෙන තිබුණ ද, එය ලබාගෙන වසර 05ක් ගතවීමට පෙර සේවය හැරගොස් ඇති බැවින්, ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක: BD/GPS/130/9/14/MC- IIහා 2015 ජූලි 07 ලිපිය ප්‍රකාරව ඔහුගෙන් යතුරුපැදියේ වෙළඳපොළ වටිනාකම වන රු.144,920ක මුදල අයකරගත යුතුව ඇතත්, එසේ අයකර ගැනීම හෝ පොත්වලින් එකී වටිනාකම කපාහැරීමක් සිදුව නොතිබූ අතර, ඒ පිළිබඳ තොරතුරු කිසිවක් 2024 මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් නොවුණි.	අවශ්‍ය උපදෙස් ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට විගණන හා කළමනාකරණ රැස්වීමේදී එකඟතාවය ලබාගෙන ඇති අතර, ඒ අනුව කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	

4.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 (ආ) ප්‍රකාරව, තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් වාර්තා සටහන් කවර හෝ සාමාජිකයෙකුට තමන් එකඟ නොවන බව වාර්තාගත කළ හැකි අතර, කේත කියවන යන්ත්‍ර (QR readers) 75ක් රු.2,025,000(බදු රහිත) වටිනාකමකට මිලදීගැනීමට අදාළව 2024 පෙබරවාරි 5 දින පැවැති 01 වන තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි සභාපති විසින් එකඟවීම හෝ එකඟ නොවීම සඳහන් නොකර අත්සන් තබා තිබුණි.	තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සඳහා එකඟවීම හෝ එකඟ නොවීම සටහන් නොකිරීම අතපසුවීමකින් සිදුවී ඇති අතර, මින් ඉදිරියට එවැනි අතපසුවීම් වළක්වා ගැනීමට කටයුතු කරමි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

4.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 අංක 8 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතින් සංශෝධිත 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 39(ආ) (ඇ) ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව යම් නියමිත අධිකාරියක් විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් සඳහා ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත සහිතව එම හැඳුනුම්පත දරන්නා පිළිබඳ විස්තරවල සත්‍යතාවය සහතික කරනු ලැබිය හැකි අතර, දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුම්වලට (MOU) එළැඹි ආයතන විසින් ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත ලබාගැනීමෙන් අනතුරුව තොරතුරු සත්‍යාපනයකර ගැනීම සිදුකළ යුතු වේ. නමුත් ගිවිසුම්ගත ආයතන විසින් පුද්ගලයන්ගේ තොරතුරු සත්‍යාපනයකර ගැනීමේදී ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත සත්‍ය වශයෙන්ම ලබාගෙන ඇත් ද, යන්න පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් නියැදි පරීක්ෂාවක් හෝ මෙම සේවාව ආරම්භයේ සිට විගණිත දින දක්වාම සිදුකර තිබූ බවට විගණනයේදී තොරතුරු අනාවරණය නොවුණි.	2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනතට අනුව, ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත ලබා ගැනීමෙන් අනතුරුව පුද්ගල තොරතුරු සත්‍යාපනය කළ යුතු වේ. ගිවිසුම්ගත ආයතන එම සේවාව භාවිතා කිරීමේදී දරන්නාගේ කැමැත්ත ලබාගන්නේ දැයි පරීක්ෂාවක් සිදුනොකිරීම යන්න සම්බන්ධයෙන් පහත කරුණු දන්වා සිටිමි. i. 2016 අංක 08 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනතට අනුව ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත ලබාගැනීමෙන් අනතුරුව පුද්ගල තොරතුරු සත්‍යාපනය කළ යුතු බව සඳහන් වේ. පුද්ගලයන්ගේ තොරතුරු තහවුරුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේදී web portal හරහා පුද්ගල තොරතුරු හුවමාරු කිරීම ආරම්භ කළ අතර, 2024 වර්ෂයේදී API හරහා තොරතුරු හුවමාරුව සේවාව ආරම්භ කරන ලදී. පුද්ගල තොරතුරු හුවමාරු කිරීම සඳහා මේ වන විට ආයතන 110ක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන්කර ඇත. ii. සේවා සැපයීමට පෙර සෑම ආයතනයක් විසින්ම දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමට ඇතුළත්	පනත පරිදි කටයුතු කළ යුතු ය.

		වන අතර, පුද්ගල තොරතුරු සත්‍යාපනය කිරීමට පෙර ජාතික හැඳුනුම්පත දරන්නාගේ කැමැත්ත ලබාගත යුතු බව එහි කොන්දේසිවල ඇතුළත් වේ. අදාළ ආයතනය වෙත ආරක්ෂක මුරපද ලබාදීමට පෙර දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් අදාළ ආයතනය ආකෘතිපත්‍ර මගින් හෝ online Interface එකක් මගින් කාඩ්පත් දරන්නාගේ කැමැත්ත ලබාගන්නා ආකාරය පරීක්ෂාකර තහවුරුකර ගැනීම සිදුකරනු ලැබේ. iii. ඉදිරියේදී API සේවාව මගින් දත්ත හුවමාරු කිරීමට අපේක්ෂා කරන අතර, සේවා සපයාගන්නා ආයතන නිරන්තරයෙන් පරීක්ෂා කිරීමටත් තොරතුරු තාක්ෂණ අංශය සමග සම්බන්ධ වී ආයතන නීත්‍යානුකූලව කාඩ්පත දරන්නාගේ කැමැත්ත නිසි පරිදි ලබාගන්නේ ද යන්න කලින් කළට පරීක්ෂා කිරීමට කටයුතු කිරීමටත් අපේක්ෂා කරයි.	
(ආ)	නිලධාරියෙකුගේ වසර 10කට වැඩි කාලයක දෙපාර්තමේන්තුවට අයවිය යුතු ආපදා හා පාපැදි ණයශේෂය රු.45,413ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද නිරවුල්කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.	මෙම නිලධාරියාගේ අත්තිකාරම් “බී” ගිණුමෙහි ණයශේෂය අයකරගැනීම සඳහා නඩුඅංක 1689/18 DMR යටතේ 2018.04.27 වන දින නඩු පවරා ඇත. ඒ අනුව 2025.04.28 දින පැවති නඩුවාරය මඟින් මෙම නඩුව සම්බන්ධයෙන් අදාළ විත්තිකරුට විරුද්ධව සිතාසි කැඳවා එසේ සිතාසි කැඳවූ බවට 2025.10.17 වන මීළඟ නඩු දිනයේදී දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් වාර්ථා කළ යුතු බව දන්වා ඇති අතර, 2025.10.17 වන දිනට නඩුව කල් යන ලදී.	කඩිනමින් ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

5. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය

(අ) 2024 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1,472ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 1,321ක් වූ බැවින්, පුරප්පාඩු 151ක් නිරීක්ෂණය විය.

සේවා මට්ටම	**අනුමත තනතුරු සංඛ්‍යාව**	**2024.12.31 දිනට තථ්‍ය සංඛ්‍යාව**	**පුරප්පාඩු සංඛ්‍යාව**
ජ්‍යෙෂ්ඨ	31	23	8
තෘතීයික	4	3	1
ද්විතීය	1,288	1,192	96
ප්‍රාථමික	149	103	46
එකතුව	**1,472**	**1,321**	**151**

ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම

i. සමාලෝචිත වර්ෂයේ අවසානයට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු පිළිබඳ තොරතුරු නිවැරදි වේ.

ii. ඒකාබද්ධ සේවයට අදාළ තනතුරුවලට අදාළව 2024.12.31 දිනට පවතින පුරප්පාඩු සම්පූර්ණකර ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි මඟින් ඉල්ලීම් ඉදිරිපත්කර ඇත.

iii. තව ද, 2024.12.31 දිනට පවතින අතිරේක කොමසාරිස් ජනරාල් පුරප්පාඩු 01 මේ වන විට සම්පූර්ණකර ඇති අතර, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) හා නීති නිලධාරි තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අදාළව සහ දෙපාර්තමේන්තුගත අනෙකුත් තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාළව, රජය විසින් නිකුත් කරනු ලැබූ චක්‍රලේඛයන්ට අනුකූලව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.

නිර්දේශය

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩයෙහි පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය.

(ආ)	2024 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) හා නීති නිලධාරි ඇතුළු තනතුරු 08ක් සඳහා අනුමත සංඛ්‍යාවම පුරප්පාඩු ලෙස පැවතුණි.	i. සමාලෝචිත වර්ෂයේ අවසානයට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු පිළිබඳ තොරතුරු නිවැරදි වේ. ii. ඒකාබද්ධ සේවයට අදාළ තනතුරුවලට අදාළව 2024.12.31 දිනට පවතින පුරප්පාඩු සම්පූර්ණකර ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි මඟින් ඉල්ලීම් ඉදිරිපත්කර ඇත. iii. තව ද, 2024.12.31 දිනට පවතින අතිරේක කොමසාරිස් ජනරාල් පුරප්පාඩු 01 මේ වන විට සම්පූර්ණකර ඇති අතර, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) හා නීති නිලධාරි තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අදාළව සහ දෙපාර්තමේන්තුගත අනෙකුත් තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාළව, රජය විසින් නිකුත් කරනු ලැබූ චක්‍රලේඛයන්ට අනුකූලව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි.	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩයෙහි පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය.